# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,721 — 1959 අප්‍රේල් 9 වැනි බ්‍රහස්පතින්ද—9.4.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට නැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 897 | තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 900 | ආණ්ඩුවේ තොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 902 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායෑ සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක්ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

4. රටවැසිභාවය සහ එය කෙසේ හිමි වී ද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.

(ආ) පියා උපන් දින සහ ස්ථානය :————.

(ඉ) ඔහුගේ රටවැසිභාවය :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම්ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතු යි) :————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතු යි :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථය ලැබූ පෙළත් සඳහන් කළ යුතු යි. සහතික පිටපත් ද අමුණා එවිය යුතු යි) :————.

(ආ) සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සාමාර්ථය ලත් උසස්ම විභාගය :————.

සිංහල :————.

ඉංග්‍රීසි :————.

9. (අ) පංක්ති පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම් දින සමග විස්තර සඳහන් කරන්න :————.

(ආ) සාහිත්‍යය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම් දින සමග ඒවා ද සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳව වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටී නම්, තත්ත්වයත්, වාර්ෂික වැටුපත් සඳහන් කරන්න :————.

11. විශේෂ පළපුරුදු, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නො විය යුතු යි)—

(i) :————.
(ii) :————.
(iii) :————.

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නොවිය යුතු යි. මෑතක දී ලත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතු යි) :————.

14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග—නැතිනම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

15. වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළිවුව හොත් කිසිම වන්දි ගෙවීමක් නැති ව, මා නිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටින බව ද, මේ අයදුම් පතෙහි දැක්වෙන සියලු විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.

---

## ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### ලයිනෝ ඔපරේටර් වරයන් නව දෙනෙකු සඳහා ස්ථිර පත්වීම්

රජයේ මුද්‍රණාලයේ ලයිනෝ ඔපරේටර් වරයන් නව දෙනෙකුගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් විය යුතු ඉල්ලුම් පත්‍ර 1959 අප්‍රේල් 24 වැනි දින හෝ ඊට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතුය. නියමිත ආකෘති පත්‍රයේ සකස් වී නැති ඉල්ලුම් පත්‍ර භාර ගනු නො ලැබේ.

2. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු දින 5ක් ඇතුළත ඉල්ලුම් පත්‍රය ලැබුණු බව හැඟවීමේ දැනුම් දීමක් නොලැබුණහොත් වහාම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ඒ බැව් දන්විය යුතුය. මෙකී ප්‍රකාර ක්‍රියා නොකළහොත් සළකා බැලීම සඳහා තිබෙන අයිතිවාසිකම්වලට ඉල්ලුම්කරු අහිමි වනු ඇත.

3. තෝරා ගැනීමට ප්‍රථම නියමිත සුදුසුකම් ඇති අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට භාජන කරනු ලැබේ.

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—ආණ්ඩුවේ සේවයට කෙරෙන පත්කිරීම් පිළිබඳව ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි කොටසේ සඳහන් වන සාමාන්‍ය නීති රීති ඉල්ලුම් කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුය.

5. අයදුම් කරුවන් සාර්ථක ලෙස අවුරුදු පහක ආධුනික සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

6. **වැටුප්.**—2 වන ශ්‍රේණියේ ස්ථිර තනතුර සඳහා අදාළ වැටුප් ක්‍රමය නම් : රුපියල් 1,380—42—රුපියල් 1,842. ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව සහ තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ආණ්ඩුවේ රෙගුලාසීන්ට අනුව ගෙවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම් කරුවන් තුන් අවුරුදු සෝදිසි කාලයක් යටතේ පත්කර ගනු ලැබේ.

7. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටීමට සහ දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ වැඩ කිරීමට නියම කරනු ලැබේ.

8. ආදර්ශ ආකෘති පත්‍රයේ 8 (ඇ) දරණ පේලියෙන් අවශ්‍යයැයි පෙන්වා ඇති ළඟදී ලබා ගන්නා ලද සහතික පිටපත් (ඒවා ආපසු එවනු නොලැබේ.) තුනක් අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුය. යටත් පිරිසෙයින් ඉන් දෙකක්වත් අයදුම්කරුගේ චරිතය සහ සෘජු භාවය පිළිබඳ සහතික විය යුතුය. ඉල්ලුම් පත්‍රය පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස්කර ගත යුතුය. මුද්‍රිත ආකෘති පත්‍ර නොමැත. ඉල්ලුම් පත්‍ර ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුය. පෞද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ වෙන කවර නිලධාරියකුගේ හෝ නමට නො එවිය යුතුය.

9. කිසියම් අයදුම්කරුවකු වෙනුවෙන් ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති හෝ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියකු සම්මුඛව සාකච්ඡා කිරීමට උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම එම අයදුම් කරු නුසුදුසු බවට පත් වන්නේ ය.

10. යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

11. මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර හෝ ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1959 අප්‍රේල් 6 දින,
කොළඹ ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

#### ලයිනෝ ඔපරේටර් වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) (අ) ඉල්ලුම්කරු උපන් දිනය සහ ගම :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ගම :————.

(4) ඉල්ලුම්කරුගේ වයස : අවුරුදු :————, මාස :————.

(5) විවාහක හෝ අවිවාහක බව :————.

(6) ජාතිය—

(අ) ලාංකිකයකු නම් ලියාපදිංචි වීමෙන් ද පරම්පරාවෙන් ද යන වග :————.

(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ඔබ ලාංකිකයකු නොවන්නෙහි නම් ලියාපදිංචි වීමෙන් ලංකා පුරවැසි බව ලබාගැනීමට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා වෙත ඉල්ලුම්කර යැවුවෙහිද ? මේ සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ගයක් වේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(7) ලයිනෝ ඔපරේටර් වරයකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර සහ අයදුම්කරු වැඩ කරන ලද වෙළඳ සමාගම්වල නම් :————.

(8) පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුයි—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිතය හා දක්ෂතාවයන් පිළිබඳ සහතික තුනක් ;

(ඈ) ඉහත සඳහන් අංක 7 දරණ තීරයේ කරුණු සනාථ කිරීම සඳහා සහතික.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්‍ය්‍යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය (ඉංග්‍රීසි,) 1959 ජනවාරි

1959 ජනවාරි මස 10 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්‍ය්‍යක්ෂමතා කඩඉමෙන් සාමර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| අම්සාර්, එම්. ඒ. ... | ... දිස්ත්‍රික් උසාවිය, නුවරඑළිය ... | ... ලඝු ලේඛනය සහ රචනය |
| කබ්‍රාල්, එල්. ඒ. ආර්. ... | ... අරාබි එක්සත් ආණ්ඩුවේ ලංකා තානාපති කාර්‍ය්‍යාලයය, කෛරෝ, ඊජිප්තුව | ... සිංහල |
| කොක්, ඩබ්ලියු. එම්. ... | ... අග්‍රාණ්ඩුකාර තුමාගේ කාර්‍ය්‍යාලය ... | ... රචනය |
| ජයසේකර, පී. ඩබ්ලියු. එස්. | ... පළාත් පාලන ... ... | ... ලඝු ලේඛනය සහ සිංහල |
| ජීවරත්න, ඩී. වී. ජී. ... | ... ඉන්දියාවේ ලංකා වෙළඳ කොමසාරිස් කාර්‍ය්‍යාලයය | ... රචනය සහ සිංහල |
| ද සිල්වා, ඒ. එල්. ඩී. සී. ඊ. | ... දිස්ත්‍රික් උසාවිය, මාතර ... ... | ... ලඝු ලේඛනය සහ රචනය |
| ධර්මරත්න, ඒ. ටී. ... | ... දිස්ත්‍රික් උසාවිය, කොළඹ ... | ... ලඝු ලේඛනය |
| පීරිස්, එම්. එස්. ආර්. එම්. | ... සෞඛ්‍ය ... | ... රචනය |
| පෙරේරා, ආර්. එම්. ඩබ්ලියු. | ... දිස්ත්‍රික් උසාවිය, කොළඹ ... | ... ලඝු ලේඛනය සහ රචනය |
| පෙරේරා, ඕ. බී. ඩී. ... | ... දිස්ත්‍රික් උසාවිය, පානදුර ... | ... ලඝු ලේඛනය |
| පෙරේරා, ඩබ්ලිව්. එම්. එම්. ජේ. | ... දිස්ත්‍රික් උසාවිය, අවිස්සාවේල්ල ... | ... ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, ජේ. ජේ. අයි. එල්. | ... දිස්ත්‍රික් උසාවිය, කළුතර ... | ... ලඝු ලේඛනය සහ සිංහල |
| ෆෙපරෙයිරා, සී. ආර් ... | ... මහෙස්ත්‍රාත් උසාවිය, දකුණු කොළඹ ... | ... රචනය |
| බ්ලේක්, ඩී. ජේ. ජී. ... | ... දිස්ත්‍රික් උසාවිය, කොළඹ ... | ... ලඝු ලේඛනය |
| රොද්රිගෝ, බී. ජේ. ජේ. ... | ... කම්කරු ... | ... සිංහල |
| විජේදස, කේ. එල්. ... | ... නියෝජිත මන්ත්‍රණ සභා නායක හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ කාර්‍ය්‍යාලයය | ලඝු ලේඛනය |
| විජේනායක, ඒ. එච්. එම්. | ... දිස්ත්‍රික් උසාවිය, ගම්පහ ... | ... ලඝු ලේඛනය සහ රචනය |
| විද්‍යාරත්න, ටී. ... | ... මුදල් අමාත්‍යාංශය ... | ... ලඝු ලේඛනය |
| වීරවර්ධන, ඩී. එස්. ද ඉසෙඩ් | ... බන්ධනාගාර ... | ... ලඝු ලේඛනය |
| සබාපති, එම්. ... | ... දිස්ත්‍රික් උසාවිය, පේදුරු තුඩුව ... | ... රචනය |
| සැලී, ටී. එම්. වයි. ... | ... දිස්ත්‍රික් උසාවිය, මාතර ... | ... ලඝු ලේඛනය සහ රචනය |
| සිල්වා, එස්. ඊ. එල්. ... | ... ඇටෝර්නි ජනරාල්ගේ කාර්‍ය්‍යාලය ... | ... රචනය |
| සේනානායක, ඒ. එම්. පී. ඒ. | ... මහා භාණ්ඩාගාරය ... | ... සිංහල |

2. පහත සඳහන් අපෙක්ෂකයන් සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අම්සාර්, එම්. ඒ. ... ... | ... දිස්ත්‍රික් උසාවිය, නුවරඑළිය |
| කබ්‍රාල්, එල්. ඒ. ආර්. ... ... | ... අරාබි එක්සත් ආණ්ඩුවේ ලංකා තානාපති කාර්‍ය්‍යාලයය, කෛරෝ, ඊජිප්තුව |
| ධර්මරත්න, ඒ. ටී. ... ... | ... දිස්ත්‍රික් උසාවිය, කොළඹ |
| පෙරේරා, ආර්. එම්. ඩබ්ලියු. ... | ... දිස්ත්‍රික් උසාවිය, කොළඹ |
| පෙරේරා, ඕ. බී. ඩී. ... | ... දිස්ත්‍රික් උසාවිය, පානදුර |
| පෙරේරා, ඩබ්ලියු එම්. එම්. ජේ. ... | ... දිස්ත්‍රික් උසාවිය, අවිස්සාවේල්ල |
| ප්‍රනාන්දු, ජේ. ජේ. අයි. එල්. ... | ... දිස්ත්‍රික් උසාවිය, කළුතර |
| විජේදස, කේ. එල්. ... ... | ... නියෝජිත මන්ත්‍රණ සභා නායක හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ කාර්‍ය්‍යාලයය |
| විජේනායක, ඒ. එච්. එම්. ... | ... දිස්ත්‍රික් උසාවිය, ගම්පහ |
| විද්‍යාරත්න, ටී. ... ... | ... මුදල් අමාත්‍යාංශය |
| සබාපති, එම්. ... ... | ... දිස්ත්‍රික් උසාවිය, පේදුරු තුඩුව |

1959 අප්‍රෙල් මස 6 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

ඩී. ජී. එල්. මීසෝ,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) විභාගය, 1959 ජනවාරි

1959 ජනවාරි මස 10 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරිම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවනට යටත්ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛක, ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| අය්යදෙරේ, බී. එස්. (මෙනවිය) | ... පළාත් පාලන | ... දෙමළ |
| ඉස්මයිල්, එම්. එම්. එම්. ... | ... ප්‍රසිද්ධ වැඩ | ... ඉංග්‍රීසි සහ දෙමළ |
| එදිරිවීරසිංහ, ජේ. බී. ... | ... දිස්ත්‍රික් උසාවිය, යාපනය | ... ඉංග්‍රීසි |

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| කනගරත්නම්, පී. | දිස්ත්‍රික් උසාවිය, බදුල්ල | දෙමළ |
| කනගරාජා, එස්. | දිස්ත්‍රික් උසාවිය, කල්මුනේ | දෙමළ |
| කරුණාරත්න, ඩී. පී. | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන | ලඝු ලේඛනය |
| කාදර්, ඒ. ආර්. ඒ. | ඇටෝර්නි ජනරාල්ගේ | සිංහල |
| ගෝමස්, පී. ටී. (මහත්මිය) | නියෝජිත මන්ත්‍රණ සභානායක සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ කාර්යාලය | ඉංග්‍රීසි සහ සිංහල |
| ජයවර්ධන, ජේ. සී. | සෞඛ්‍ය | සිංහල |
| ද සිල්වා, ඊ. සී. (මහත්මිය) | ලංකා කාර්මික විද්‍යාලයය | ලඝු ලේඛනය |
| පියසේන, එම්. සී. ද එස්. | ඇටෝර්නි ජනරාල්ගේ | ඉංග්‍රීසි සහ සිංහල |
| පෙරේරා, ජේ, ඒ. එන්. | ආදායම් බදු | සිංහල |
| පෝන්සේකා, ජී. ඩී. සී. | දුම්රිය | ඉංග්‍රීසි සහ සිංහල |
| ප්‍රනාන්දු, එන්. වී. සී. (මෙනවිය) | කෘෂිකර්ම හා ආහාර පිළිබඳ අමාත්‍යාංශය | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, එස්. ජේ. එම්. | නීති කෙටුම්පත් කරුගේ | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, ටී. පී. | ඇටෝර්නි ජනරාල්ගේ | ඉංග්‍රීසි සහ සිංහල |
| මාර්කස්, එස්. පී. | ආහාර කොමසාරිස්ගේ | දෙමළ |
| විජේදස, කේ. ජී. | ආණ්ඩුවේ දෙශ සංචාරක කාර්යාංශය | ඉංග්‍රීසි සහ ලඝු ලේඛනය |
| විජේසිංහ, එච්. එස්. | ඉඩම් සංවර්ධන | ඉංග්‍රීසි |
| විතාරන, පී. | සෞඛ්‍ය | ඉංග්‍රීසි |
| සිරිසෝම, එම්. | මහේස්ත්‍රාත් උසාවිය, ගාල්ල | ඉංග්‍රීසි සහ සිංහල |
| සිල්වා, ඒ. සී. | ප්‍රධාන මහේස්ත්‍රාත් උසාවිය, කොළඹ | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂිකයන් සහ අපේක්ෂිකාව පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සමර්ථ වී ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| කරුණාරත්න, ඩී. පී. | ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන |
| ද සිල්වා, ඊ. සී. (මහත්මිය) | ලංකා කාර්මික විද්‍යාලයය |
| ප්‍රනාන්දු, එස්. ජේ. එම්. | නීති කෙටුම්පත් කරුගේ |
| විජේදස, කේ. ජී. | ආණ්ඩුවේ දෙශ සංචාරක කාර්යාංශය |
| සිල්වා, ඒ. සී. | ප්‍රධාන මහේස්ත්‍රාත් උසාවිය, කොළඹ |

1959 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

ඩී. ජී. ඇල්. මිසෝ,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7(ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, (සිංහළ) 1959 ජනවාරි

1959 ජනවාරි මස 10 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයා සහ ලේඛිකාව, ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| පනාගොඩ, ඩී. ජේ. | මෝටර් රථ ගමනා ගමන | රචනය |
| විල්සන්, ටී. (මහත්මිය) | කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය | රචනය සහ ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂිකාව සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| විල්සන්, ටී. (මහත්මිය) | කර්මාන්ත සහ ධීවර අමාත්‍යාංශය |

1959 අප්‍රියෙල් මස 6 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

ඩී. ජී. එල්. මීසෝ,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (සිංහල) විභාගය, 1959 ජනවාරි

1959 ජනවාරි මස 10 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවනට යටත්ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛක, ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| කරුණාරත්න, එන්. | ආහාර කොමසාරිස්ගේ | ලඝු ලේඛනය |
| කරුණාරත්න, ටී. ඩබ්ලිව්. | රේගු | ලඝු ලේඛනය |
| කරුණාරත්න, පී. | කම්කරු, නිවාස හා සමාජ සේවා අමාත්‍යාංශය | ලඝු ලේඛනය |

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| කුරුකුලනාථ, ටී. ඩී. (මෙනෙවිය) | ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශය | සිංහල |
| ජයවතී, එස්. ඒ. (මෙනෙවිය) | තැපැල්, ගුවන් විදුලිය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | සිංහල සහ ලඝු ලේඛනය |
| ජයසූරිය, ජේ. ඒ. ඩී. ඩී. | සංස්කෘතික කටයුතු | ලඝු ලේඛනය |
| ජිනදාස, ඒ. එච්. | ප්‍රවෘත්ති | ලඝු ලේඛනය |
| දිසානායක, එච්. බී. | ගොවි ද්‍රව්‍ය අලෙවි කිරීමේ | සිංහල |
| පීරිස්, ටී. ඩී. එම්. (මෙනෙවිය) | කම්කරු | සිංහල සහ ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, කේ. පී. ඩී. | මහා භාරකාර තුමාගේ | ලඝු ලේඛනය |
| යසවතී, ආර්. පී. මෙනෙවිය | අධ්‍යාපන අමාත්‍යාංශය | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන් පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සමර්ථ වී ඇත :

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| කරුණාරත්න, එන්. | ආහාර කොමසාරිස්ගේ |
| කරුණාරත්න, ටී. ඩබ්ලිව්. | රේගු |
| කරුණාරත්න, පී. | කම්කරු, නිවාස හා සමාජ සේවා අමාත්‍යාංශය |
| ජයවතී, එස්. ඒ. (මෙනෙවිය) | තැපැල්, ගුවන් විදුලිය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය |
| ජයසූරිය, ජේ. ඒ. ඩී. ඩී. | සංස්කෘතික කටයුතු |
| ජිනදාස, ඒ. එච්. | ප්‍රවෘත්ති |
| පීරිස්, ටී. ඩී. එම්. (මෙනෙවිය) | කම්කරු |
| යසවතී, ආර්. පී. (මෙනෙවිය) | අධ්‍යාපන අමාත්‍යාංශය |

1959 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

ඩී. ජී. එල්. මිසෝ,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

---

මගේ අංකය : ඊ බී ඒ/35/57 (11)

## ආරෝග්‍යශාලා ලිපිකරු සේවා විභාගය—මාර්තු, 1958

1958 දෙසැම්බර් මස 5 වැනි දින නිකුත් කරන ලද අංක 11,608 දරණ ගැසට් පත්‍රයෙහි පළවූ 1958 නොවැම්බර් 8 වැනි දින දරණ නිවේදනයට එක් කිරීම සඳහා පහත නම් සඳහන් අයදුම් කරුවන් ද 1958 මාර්තු මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකරු සේවා විභාගයේ ප්‍රතිඵල අනුව ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ 2 වැනි පන්තියට පත් කිරීම සඳහා තෝරාගෙන ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | ලිපිනය |
|---|---|
| බාර්නිස් හාමි, කේ. ඇල්. ඒ. | ගම්සභා කාර්යාලය, කළුකර පහළ, පන් විලතැන් න. |
| චන්ද්‍රරත් න, ජේ. ඇම්. | උඩතව, යලතවල, වැවගම. |
| ඩැනී, කේ. පී. | අ/හොරවිල රජයේ මිශ්‍ර පාඨශාලාව, හොරවිල, අනුරාධපුරය |
| ධර්මසේන, ඒ. පී. | සී. පී. බැස් තියන් සිල් වා මහත් මයා බාරේ ගෝනාපීනුවල. |
| ප්‍රනාන් දු, පී. පී. | නො. 10, ජනප්‍රිය මාවත, කොරලවැල් ල, මොරටුව. |
| ජයසිංහ, ඇන්. ආර්. | දෙහිගහහේන, නුන් ගමුව, සපිගල් ඔලුව. |
| ජයවීර, පී. ඇම්. | නො. 46/2, ශ්‍රී මංගල පාර, මාතර. |
| මහින් දදාස, කේ. ආර්. | නිමලව වත් ත, ඉමදුව. |
| පෙරේරා, කේ. ඩී. | මඩිතියවල, බාඳුරාගොඩ. |
| පියදාස, ආර්. පී. | පෙල් ලපිටිය, උඩහේන් තැන් න. |
| පුණ්‍යමූර්ති, කේ. | නො. 505, කෙළින් වීදිය, මාතලේ. |
| රාසයියා, ඇස්. | පුංගඩතිව් බටහිර, පුංගඩතිව්. |
| සෙනෙවිරත් න බණ්ඩා, ඩී. ආර්. | රන් දිවෙල පාසැල, මාවනැල් ල. |
| වීරමන්, පී. | බෙරලපනාතර. |
| වීරසිංහ, ටී. පී. | පේරමඩුල් ල, හිඟුල. |

2. අයදුම්කරුවන් ට වහාම පත් වීම් දීමට ආණ්ඩුව බැඳී නැත. එහෙත් පුරප් පාඩු ඇති වන අන් දමට පත් වීම් දෙනු ලැබේ. සෑම පත් වීමක් ම දෙනු ලබන් නේ තුන් වසක සෝදිසි කාලයකට ය. වෛද්‍ය පරීක් ෂණයකට මුහුණ දිය යුතු ඔවුහු ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ කොන් දේසිවලට ද යටත් වන් නාහ.

ඩී. ඇල්. ජේ. කහවිට,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1959 මාර්තු මස 31 වැනි දින,
කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදීය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන් තර සහයෝගතා සංවිධානය (*ICA*)

ගමනාගමනය හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ටැන් ඩර් මණ් ඩලයේ සභාපති තුමන් විසින් 1959 ජූලි 1 වෙනි දින පෙරවරු 9.30 දක් වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ලෝ-බෙඩ් සෙමි-ට්‍රේලර් හා ට්‍රැක් ටර් (ටැන් ඩර් අංක ICA/DLF-20) සැපයීම සඳහා ටැන් ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කොළඹ පාසන් ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටැන් ඩර් පෝර්ම ලබා ගත හැක. ටැන් ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටැන් ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන් ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස් තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගතහැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 අප්‍රේල් 4 වෙනි දින,
කොළඹ.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ් ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන් ඩර් මණ් ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන උපකරණවලින් රූල් ගසාපු සහ නොගසාපු පොත් සාදා සැපයීම සඳහා 1959 අප්‍රේල් 28 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන් ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන් ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන් ඩර්කරුවන් ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන් ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන් ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන් ඩර් තැන් පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන් සියක් ඉදිරිපත් කළවිට 1959 අප්‍රේල් 27 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන් ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස් තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ දීය.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1) කාකි රෙදි (Khaki Cotton Drill) සැපයීම සඳහා 1959 අප්‍රේල් 28 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1959 අප්‍රේ 27 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 අප්‍රේල් 9වැනි දින,
කොළඹදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පේරාදෙනියේ පී. ඩබ්ලිව්. ඩී. 5 බී ගොඩනැගිල්ල සෑදීම

කොළඹ යූනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959. 5. 25 පස්වරු 2.30 වනතෙක් ඉහත සඳහන් ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ෆෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ පරිපාලක නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක්ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයෙහි "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ" යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ "පෙරාදෙනියේ පී. ඩබ්ලිව්. ඩී. 5 බී ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ද ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැත්නම් ඒවා රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැනවූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ "පේරාදෙනියේ පී. ඩබ්ලිව්. ඩී. 5 බී ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවකු විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින හතරක් ඇතුළතදී නොලැබුනේ නම් ඒ ගැන කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. මෙම ගොඩනැගිල්ල සඳහා රු. 50,000 කට වඩා ආණ්ඩුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1959. 5. 25. දවල් 12 වනතෙක් (සතියේ දිනයක පස්වරු 4 දක්වාද, සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වාද) එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ රු. 150ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rate) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතු වේ.

7. ටෙන්ඩර් කරුවන් තමන්ගේ ලිපිනය ඉතා පැහැදිලි අකුරෙන් ලියා එවිය යුතුයි.

8. ටෙන්ඩර් කරුවන් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් මේ ගොඩනැගිලි සම්බන්ධ ප්ලෑන, දිග, පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබාගත යුතුයි. සෑම ටෙන්ඩර් කරුවෙක්ම මේ ගොඩනැගිලි සෑදීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර් පත්‍ර යැව්වොත් මැනවි.

9. ටෙන්ඩර් පත්‍ර සඳහන්වූද පිළිගනු ලැබුවාවූද වැඩෙහි මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත් කරුවාගෙන් යම්කිසි මුදලක් අය කර ගැනීමට නොතිබුණොත් පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක විය යුතුවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතුද වේ.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට සති හයක් යන තුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර පත්‍ර හෝ ප්‍රතික්ෂෙප කිරීමටද ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් පිළිගනීමටද බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

13. ටෙන්ඩර පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැනීමට පත් කරනු ලැබූ ටෙන්ඩර කරුවාට නියම කරනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරන කම්කරු වන්දි ආඥපණත (117 වැනි පරිච්ඡෙදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කාරයා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම ගොඩනැගිලි සෑදීමට තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යෑමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර එය පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද යම්කිසි අවස්ථාවක වැළැක්විය නොහැකි කරුණු කරණකොට ගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලබාගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගෙන් මාර්ගයෙන් ලබාගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වනවා ඇත. තවද කොන්ත්‍රාත් කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විසින් බලය දෙන ලද නිලධාරියකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපැලෙන් යැවුව හොත් එසේ නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙනගොස් දුන්නොත් ඔහුට භාර දුන්නාකොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇප කරුවන් දෙදෙනකු සොයා ගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇප කරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනකුගේ නමක් සමඟ නම ඇතුලුවූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපලේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන.

අංකය: ඩී. ඇෆ් සී 343.
1959 අප්‍රේල් මස 2 වැනි දින,
පේරාදෙණියේ දීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කන්තලේ පී. ඩබ්ලිව්. ඩී. 5බී ගොඩනැගිල්ල සෑදීම

කොළඹ යූනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959.5.25 වැනි දින පස්වරු 2.30 වනතෙක් ඉහත සඳහන් ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ පරිපාලක නිලධාරී තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක්ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයෙහි "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ" යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ "කන්තලේ පී. ඩබ්ලිව්. ඩී. 5බී ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ද ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැත්නම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරී තැනවූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි "කන්තලේ පී. ඩබ්ලිව්. ඩී. 5බී ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවකු විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින හතරක් ඇතුළතදී නොලැබුනේ නම් ඒ ගැන කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. මෙම ගොඩනැගිල්ල සඳහා රු. 50,000 කට වඩා ආණ්ඩුවේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් 1959.5.25 වැනි දින දවල් 12 වනතෙක් (සතියේ දිනයක පස්වරු 4 දක්වාද, සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වාද) එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ රු. 150ක මුදලක් තැන්පත්කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rate) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩරකරුවාගේ කෙටි අත්සනද තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තමන්ගේ ලිපිනය ඉතා පැහැදිලි අකුරෙන් ලියා එවිය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් මේ ගොඩනැගිලි සම්බන්ධ ප්ලෑන, දිග, පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබාගත යුතුයි. සෑම ටෙන්ඩර්කරුවෙක්ම මේ ගොඩනැගිලි සෑදීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර් පත්‍ර යැව්වොත් මැනවි.

9. ටෙන්ඩර් පත්‍ර සඳහන්වූද පිළිගනු ලැබුවාවූද වැඩෙහි මුලු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත්කරුවාගෙන් යම්කිසි මුදලක් අය කර ගැනීමට නොතිබුණොත් පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක විය යුතුවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතුද වේ.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට සති හයක් යන තුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමටද ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමටද බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

13. ටෙන්ඩර පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැනීමට පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරන කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කාරයා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම ගොඩනැගිලි සෑදීමට තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යෑමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර එය පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද යම්කිසි අවස්ථාවක වැළැක්විය නොහැකි කරුණු කරණකොට ගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලබාගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ මාර්ගයෙන් ලබාගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වනවා ඇත. තවද කොන්ත්‍රාත්කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විසින් බලය දෙන ලද නිලධාරියකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුව හොත් එසේ නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නොත් ඔහුට භාර දුන්නාකොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනකු සොයා ගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනකුගේ නමක් සමඟ නම ඇතුලුවූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නො කිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපලේ පරිපාලන නිලධාරී තැනගෙන් ලබා ගත යුතුයි.

ඇම් ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂතැන.

අංකය : ඩී. ඇෆ්. සී. 342.
1959 අප්‍රේල් මස 2 වැනි දින,
පේරාදෙණියේ දී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 9,300 හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් රත්මලානේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ශාලාව සහ යන්ත්‍ර ගබඩාව වැඩි දියුණු කිරීම (300′ × 50′ පූර්වවූ ගොඩනැගිල්ල) සඳහා 1959 මැයි මස 4 වෙනි සඳුදා උදය 11.30 වන තෙක් කොළඹ 8, කොටා රෝඩ්හි බටහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

අනුපිටපතක් සමඟ එවිය යුතු ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ 5 ජාවත්ත පාරේ පිහිටි ගොඩනැගිලි අංශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් පත්‍ර ලබාගනු කැමැත්තන් විසින් ඒ සඳහා එක ටෙන්ඩර් පත්‍රයකට රු. 25 බැගින් එම කාර්යාලයෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා ලියාපදිංචි කරන ලද රැකෝඩ් පොතද ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 30.4.59 දින සවස 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

සැලැස්ම බලා ගැනීමත් වැඩි විස්තර ලබා ගැනීමත් මෙහි පහත සඳහන් කාර්යාලයෙන් කළ හැකිය.

කිසිම විමසීමක් නැතිව ඕනෑම ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් පිලිගැනීමේ හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකිය.

දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩය හෝ වැඩ භාර නිලධාරීන්ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක අන්දමින් කරගෙන යන බව හා දැනට තිබෙන වැඩ ගැනද සහතික ඉදිරිපත් කළ යුතුය.

එන්. ඩබ්ලිව්. සුරවීර,
උප ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන.

ගොඩනැගිලි අංශය භාර
උප ප්‍රා. වා. ම. ඉංජිනේරුතැනගේ කාර්යාලය,
ජාවත්ත පාර,
කොළඹ 5.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 45,000 හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලොරි ගරාජය සෑදීම සඳහා 1959 මැයි මස 4 වෙනි සඳුදා උදය 11.30 වන තෙක් කොළඹ 8, කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

අනුපිටපතක් සමග එවිය යුතු ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ජාවත්ත පාරේ පිහිටි ගොඩනැගිලි අංශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් පත්‍ර ලබාගනු කැමැත්තන් විසින් ඒ සඳහා එක ටෙන්ඩර් පත්‍රයකට රු. 50 බැගින් එම කාර්යාලයෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා ලියාපදිංචි කරන ලද රෙකෝඩ් පොතද ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 30.4.59 දින සවස 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

සැලැස්ම බලා ගැනීමත් වැඩි විස්තර ලබා ගැනීමත් මෙහි පහත සඳහන් කාර්යාලයෙන් කළ හැකිය.

කිසිම විමසීමක් නැතිව ඕනෑම ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් පිළිගැනීමේ හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකිය.

දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩය හෝ වැඩ භාර නිලධාරීන්ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක අන්දමින් කරගෙන යන බව හා දැනට තිබෙන වැඩ ගැනද සහතික ඉදිරිපත් කළ යුතුය.

එන්. ඩබ්ලිව්. සුරවීර,
උප ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන.

ගොඩනැගිලි අංශය භාර
උප ප්‍රා. වා. ම. ඉංජිනේරුතැනගේ කාර්යාලය,
ජාවත්ත පාර,
කොළඹ 5.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 10,500 හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් රත්මලානේ නඩත්තු ස්ටෝරු ගබඩාවක් සෑදීම සඳහා 1959 මැයි මස 4 වෙනි සඳුදා උදය 11.30 වනතෙක් කොළඹ 8, කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

අනුපිටපතක් සමග එවිය යුතු ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ජාවත්ත පාරේ පිහිටි ගොඩනැගිලි අංශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් පත්‍ර ලබාගනු කැමැත්තන් විසින් ඒ සඳහා එක ටෙන්ඩර් පත්‍රයකට රු. 25 බැගින් එම කාර්යාලයෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා ලියාපදිංචි කරන ලද රෙකෝඩ් පොතද ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 30.4.59 දින සවස 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

සැලැස්ම බලා ගැනීමත් වැඩි විස්තර ලබා ගැනීමත් මෙහි පහත සඳහන් කාර්යාලයෙන් කළ හැකිය.

කිසිම විමසීමක් නැතිව ඕනෑම ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් පිළිගැනීමේ හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකිය.



දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩය හෝ වැඩ භාර නිලධාරීන්ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක අන්දමින් කරගෙන යන බව හා දැනට තිබෙන වැඩ ගැනද සහතික ඉදිරිපත් කළ යුතුය.

එන්. ඩබ්ලිව්. සුරවීර,
උප ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන.

ගොඩනැගිලි අංශය භාර
උප ප්‍රා. වා. ම. ඉංජිනේරුතැනගේ කාර්යාලය,
ජාවත්ත පාර,
කොළඹ ,5.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මධ්‍යම ප්‍රාදෙශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ජලගැල්මෙන් විනාශවූ විලත්තාව අමුණ අළුත් වැඩියා කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 5,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටැන්ඩර් 1959 අප්‍රේල් මස 22 වැනි බදාදා පෙරවරු 9.30 වනතුරු භාරගනු ලැබෙත්.

ටැන්ඩර් පෝරම 1959 අප්‍රේල් මස 15 වැනි බදාදා සිට 20 වැනි සඳුදා වන තෙක් නාලන්දේ වාරිමාර්ග කාර්යාලයෙන් හෝ මහනුවර ප්‍රාදෙශික වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක. මේ සඳහා රුපියල් 25ක් තැන්පත් කොට රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුයි.

දැනටමත් ආණ්ඩුවේ කොන්ත්‍රාත් වැඩ භාර අරගෙන සිටින කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ කොන්ත්‍රාත් වැඩවල සතුටුදායක ප්‍රගතියක් ඇති බවට එම වැඩ භාර නිලධාරි තැනගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන්නේ 1959 අප්‍රේල් මස 22 වැනි බදාදා පෙරවරු 10.00ට පමණ මහනුවර ප්‍රාදෙශික වාරිමාර්ග ඉංජිනේරු තුමා විසිනි. යම්කිසි ටැන්ඩර් කරුවෙකුට උවමනානම් ටැන්ඩර් විවෘත කරන වේලාවේ ඉදිරියේ සිටිය හැක.

ඩී. වී. ධර්මලිංකම්,
වාරිමාර්ග උප කොට්ඨාශ නිලධාරි තැන,
නාලන්ද.

වාරිමාර්ග කාර්යාලය,
නාලන්ද, 1.4.59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොලොන්නරු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ඇලහැර-මින්නේරිය යෝධ ඇල පාරේ 14 වෙනි සැතපුමේ සිට 16 වෙනි සැතපුම දක්වා ගල් අතුරා දැමීමට මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 45,000කට වැඩියෙන් ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මෙම අප්‍රේල් 22 දින 9.30 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. තමන් විසින් එවන ටෙන්ඩර් පෝරම දෙකක් සම්පූර්ණකර එවිය යුතුය. මේ සම්බන්ධ සියලුම විස්තර මින්නේරියේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැක.

3. 1959 අප්‍රේල් 15 වෙනි දින සිට 20 වෙනිදා දක්වා මින්නේරියේ උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරුතුමා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා කොන්ත්‍රාත් කරුවන් විසින් රුපියල් 50ක් තැන්පත් කළ යුතුය.

4. මොන යම් කරුණක් සඳහා හෝ කොන්ත්‍රාත් කරුවන්ට ආණ්ඩුවේ ආවුද දෙනු නොලැබේ.

ජී. ඇස්. ඇම්. ෂොක්මන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මින්නේරිය උප කොට්ඨාශය,
හිරිතලේ.

වාරිමාර්ග කාර්යාලය,
හිරිතලේ.
1.4.59.

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කිරි පිටි බෙදාහැරීම, 1958-1959

කොළඹ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැන වෂී 1959ක්වූ අප්‍රේල් මස 18වෙනි සෙනසුරාදා දහවල් 10 දක්වා කිරි පිටි බෙදා හැරීම සඳහා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලබන්නේ—

(අ) වේයන්ගොඩ ආහාර බඩු ගබඩාවේ සිට එම ගබඩාව මගින් පාලනය වන වේයන්ගොඩ කොට්ඨාශයේ පාසැල්වලට කිරි පිටි සැපයීම,

(ආ) වේයන්ගොඩ ආහාර බඩු ගබඩාවේ සිට එම ගබඩාව මගින් පාලනය වන මීරිගම කොට්ඨාශයේ පාසැල්වලට කිරි පිටි සැපයීම,

වැඩි විස්තර කොළඹ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැන ගෙන් ලබාගත හැක.

එස්. ජේ. විජේසේකර,
කොළඹ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැන වෙනුවට.

1959ක් වූ අප්‍රේල් මස 1වෙනි දින,
කොළඹ කච්චේරියේ දීය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන රථවාහන අංශයට ගෙන්වා තිබෙන "බෙඩ්ෆෝඩ්" වර්ගයේ ටොන් තුනේ ලොරි හැසිවලට ඇළුමිනියම් බොඩි සෑදීම සඳහා ටෙන්ඩර් 1959 යේ මැයි මස 11 වැනි සඳුදා අපර භාග 2.30 දක්වා කොළඹ යූනියන් ප්ලේස් හි පිහිටි ගොවිකම් සහ ආහාර ඇමති කාර්යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 300ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත්කර, 1959 මැයි මස 11 වැනි සඳුදා දවල් 12 වනතුරු ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ෆෝරම කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර ඉහත සඳහන් අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගතහැක.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1959 අප්‍රේල් මස 3 වැනි දින,
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන ට්‍රිපොලි වෙළඳ සැලට 1. 5. 1959 සිට 31. 5. 1959 දක්වා ඇති කාලය තුළදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් කොළඹ යූනියන් ප්ලේස් හි පිහිටි ගොවිකම් සහ ආහාර ඇමති කාර්යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ටෙන්ඩර් ෆෝරම ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

1959 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා දවල් 12 වනතුරු ටෙන්ඩර් ෆෝරම අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස්තැන වෙනුවට.

1959 අප්‍රේල් 6 වැනි දින,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 62, චැතැම් වීදිය, කොළඹ 1.

---

## නියෝජ්‍ය ආහාර පාලක තුමන්ගේ මඩකලපුවේ පිහිටි, බඩු සැපයීමේ ස්ථාන වලින්—ප්‍රදේශයේ පාන් පුළුස්සන්නන් වෙත, රාත්තල් 50හේ මිටිවල ඇහුරූ කෙයාර් පිටි ගෙන යෑම පිළිබඳ ටෙන්ඩර් පත්‍ර

ඉහත සඳහන් සේවය සඳහා, පිටපත් දෙකකින් යුක්තවූද, සීල් තබන ලද්දවූ ටෙන්ඩර් පත්‍ර මඩකලපුවේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මන්ඩලයේ සභාපති වරයා විසින් 1959 අප්‍රේල් 24 වැනි දින පෙරවරු 9.30 දක්වා භාර ගනු ලැබේ.

2. මේ සඳහා විශෙෂ ටෙන්ඩර් ආකෘති පත්‍ර නොමැත. එහෙත් ටෙන්ඩර් කරුවන් විසින් මේ සේවය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ රාත්තල් 50හේ පිටි මිටියක් (අ) නගර සීමාව තුළ හා (ආ) නගර සීමාවෙන් පිටතත් ගෙන යාමට හැතැප්මකට වෙන වෙනම අයකරන ගාස්තු පදනම් කොට ගෙනය. නියොජ්‍ය ආහාර පාලක තුමන්ගේ මඩකලපුවේ පිහිටි, බඩු සැපයීමේ ස්ථානයේ සිට එම සැපයීමේ ස්ථානයෙන් පිටි සපයනු ලබන එම ප්‍රදේශයේ පාන් පුළුස්සන්නන් වෙත පිටි ගෙන යෑම ටෙන්ඩර් කරුවන් විසින් කළ යුතු කාර්යය වේ. සාමාන්‍යයෙන් මසකට වරක් බැගින් පිටි ගෙන ගොස් පාන් පුළුස්සන්නන්ට භාරදිය යුතුයයි බලාපොරොත්තු වනු ලැබේ.

3. තෝරාගනු ලබන ටෙන්ඩර් කරු විසින් අධ්‍යාපන නිලධාරි වරයාගෙන් නිකුත් කිරීමේ නියොග ලැබී තෙදිනක් ඇතුළත පාන් පුළුස්සන්නන් වෙත පිටිගෙන ගොස් භාර දිය යුතුයයි බලාපොරොත්තු වනු ලැබේ.

4. ටෙන්ඩර් පත්‍රයේ කපා වෙනස් කළ හා මකා සකස් කළ ස්ථානවල ටෙන්ඩර් කරු විසින් තම කෙටි අත්සන තැබිය යුතුයි.

5. තෝරාගනු ලබන ටෙන්ඩර් කරු තම කාර්යය සතුටුදායක ලෙස ඉටු කිරීමේ ඇපයක් වශයෙන් රුපියල් පන්සියය (රු. 500) ක මුදලක් කච්චේරියේ තැන්පත් කරන ලෙස නියම කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට තෙමසක් ගත වන තුරු ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට හැකිවනසේ ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තබා සිටිය යුතුය.

7. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂෙප කිරීමේ ද, ටෙන්ඩර් පත්‍රයක කුමන කොටසක් හෝ භාර ගැනීමේද හිමිකම රජය සතුය.

8. මඩකලපුවේ අධ්‍යාපන නිලධාරිවරයා විසින් සකස් කරනු ලබන ගිවිසුම් පත්‍රයේ ඇලවීම සඳහා අවශ්‍ය වටිනාකම් ඇති මුද්දර, තෝරා ගනු ලබන ටෙන්ඩර් කරු විසින් සපයා දිය යුතුය.

9. ටෙන්ඩර් මණ්ඩලයේ අවසර නොලබා, කොන්ත්‍රාත්තුවක් අන්‍යයෙකුට පැවරීම හෝ අතුරු බද්දක් දීම හෝ නො කළ යුතුය. කොන්ත්‍රාත් කරුවකු විසින් එම කොන්ත්‍රාත්තුව—ඔහු වෙනුවෙන් කරගෙන යෑම සඳහා අන්‍යයකු වෙත පවරන ඇටෝර්නි බලය නොපිළිගැනීමේ හිමිකම රජය සතුව පවතී.

10. මින් පෙර රජයේ කොන්ත්‍රාත්තුවක් නොලත් ටෙන්ඩර් කරුවකු විසින් ටෙන්ඩරය ඉදිරිපත් කිරීමේදී ඔහුගේ සම්පූර්ණ නම හා දැන් ලිපිනයද, ඔහුට අයිති දේපල, ඒවායේ ස්වභාවය හා ඒවා පිහිටි දිස්ත්‍රික්කයද, ඒවාට ඇති අයිතිවාසිකමේ ප්‍රමාණයද සඳහන් ප්‍රකාශයක් ලියා ඉදිරිපත් කළ යුතුය.

11. රජයේ කොන්ත්‍රාත් වැඩ කර තිබෙන ටෙන්ඩර් කරුවකු විසින් එසේ වැඩ කළ දෙපාර්තමේන්තුවේ නාම හා සේවය කළ දිස්ත්‍රික්කයේ නාමද ලියා ඉදිරිපත් කළ යුතුය.

12. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවට ඇතුළත් විය යුත්තේ, ලංකාවේ රජය උදෙසාත් ඒ වෙනුවෙනුත් නැගෙනහිර පළාතේ අධ්‍යාපන නිලධාරියා සමඟය. ඒ නිලධාරි වරයාගේ පදවි නාමයෙන් අදහස් කරන්නේත්, ඇතුළත් වන්නේත් එවකට ලංකාවේ රජය යටතේ එම තනතුර දරණ නිලධාරිවරයා සහ ඔහුගේ අනුප්‍රාප්තිකයනුත් ය.

13. තෝරාගනු ලබන ටෙන්ඩර් කරු විසින් අධ්‍යාපන නිලධාරි වරයා වෙත ඉදිරිපත් කරන වච්චර හා අනික් ලියකියවිලිවල නිවරද්‍යතාවය ගැන ටෙන්ඩර්කරු—අධ්‍යාපන නිලධාරි වරයාට වගකිව යුතුවේ.

14. ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර බහාලන ලියුම් කවරය සීල් තබා "මඩකලපු දිස්ත්‍රික්කයේ කෙයාර් පිටි ගෙන යාම සඳහා වූ ටෙන්ඩරයයි" යනු එම කවරය මුදුනේ ලකුණු කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන විට රෙජිස්ටර් කොට එවිය යුතුය. ප්‍රදේශ වාසී ටෙන්ඩර් කරුවන් එසේ රෙජිස්ටර් තැපෑලෙන් එවන්නට අදහස් නොකරතොත් එවැනි ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ ඒජන්ත වරුන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර, අධ්‍යාපන කන්තෝරුවේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තමන් විසින්ම බහාලිය යුතුය.

15. ලැබෙන ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන නිලධාරි වරයාගේ කාර්යාලයේ දී 1959 අප්‍රේල් මස 24 වැනි දින පෙ. ව. 9.30 පසුවූ වහාම විවෘත කරනු ලැබේ.

16. ලැබෙන ටෙන්ඩර් ඉදිරිපත් කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවා දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රයක් සමීක්ෂණය කිරීමට කැමති ඕනෑම ටෙන්ඩර් කරුවකුට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සමඟ හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකු සමඟ හෝ පිළියෙළ කර ගැනීමෙන් පසු ඉදිරිපත් කර තිබෙන ඕනෑම ටෙන්ඩර් පත්‍රයක දෙවෙනි පිටපත සමීක්ෂණය කිරීමට අවසර දෙනු ලැබේ.

සී. තනිකාසලම්,
නැගෙනහිර පළාතේ වැ. බ. අධ්‍යාපන නිලධාරි තැන.

1959.4.2.

## නියෝජ්‍ය ආහාර පාලක තුමන්ගේ ත්‍රිකුණාමලේ පිහිටි බඩු සැපයීමේ ස්ථානවලින් — ප්‍රදෙශයේ පාන් පුළුස්සන්නන් වෙත රාත්තල් පණහේ මිටිවල ඇහුරු කෙයාර් පිටි ගෙන යෑම පිළිබඳ ටැන්ඩර් පත්‍ර

ඉහත සඳහන් සේවය සඳහා පිටපත් දෙකකින් යුක්තවූද, සීල් තබන ලද්දවූද ටැන්ඩර් පත්‍ර මඩකලපුවේ අධ්‍යාපන කාර්‍යාලයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් 1959 අප්‍රේල් 24 වැනි දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

2. මේ සඳහා විශේෂ ටැන්ඩර් ආකෘති පත්‍ර නොමැත. එහෙත් ටැන්ඩර් කරුවන් විසින් මේ සේවය සඳහා ටැන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ රාත්තල් 50හේ පිටි මිටියක්, මෙහි අගට යොදා තිබෙන උප ලේඛනයේ සඳහන්, ඒ ඒ ස්ථාන අතර ගෙන යාමට හැතැප්මයකට අයකරන ගාස්තුව පදනම් කොට ගෙනය. නියෝජ්‍ය ආහාර පාලක තුමන්ගේ ත්‍රිකුණාමලේ, පිහිටි බඩු සැපයීමේ ස්ථානයේ සිට—එම සැපයීමේ ස්ථානයෙන් පිටි සපයනු ලබන එම ප්‍රදේශයේ පාන් පුළුස්සන්නන් වෙත පිටි ගෙනයෑම ටැන්ඩර් කරුවන් විසින් කළ යුතු කාර්‍යය වේ. සාමාන්‍යයෙන් මසකට වරක් බැගින් පිටි ගෙන ගොස් පාන් පුළුස්සන්නන්ට භාර දිය යුතුයයි බලාපොරොත්තු වනු ලැබේ.

3. තෝරාගනු ලබන ටැන්ඩර්කරු විසින් අධ්‍යාපන නිලධාරි වරයාගෙන් නිකුත් කිරීමේ නියොග ලැබී තෙදිනක් ඇතුළත පාන් පුළුස්සන්නන් වෙත පිටිගෙන ගොස් භාර දිය යුතුයයි බලාපොරොත්තු වනු ලැබේ.

4. ටැන්ඩර් පත්‍රයේ කපා වෙනස් කළ හා මකා සකස් කළ ස්ථානවල ටැන්ඩර් කරු විසින් තම කෙටි අත්සන තැබිය යුතුයි.

5. තෝරාගනු ලබන ටැන්ඩර් කරු තම කාර්‍යය සතුටුදායක ලෙස ඉටු කිරීමේ ඇපයක් වශයෙන් රුපියල් පන්සියය (රු. 500) ක මුදලක් කච්චේරියේ තැන්පත් කරන ලෙස නියම කරනු ලැබේ.

6. ටැන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට තෙමසක් ගත වන තුරු ටැන්ඩර් පත්‍ර භාර ගැනීමට හැකිවනසේ ටැන්ඩර් කරුවන් තම ටැන්ඩර් පත්‍ර විවෘතව තබා සිටිය යුතුය.

7. යම්කිසි ටැන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටැන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂෙප කිරීමේ ද, ටැන්ඩර් පත්‍රයක කුමන කොටසක් හෝ භාර ගැනීමේද හිමිකම රජය සතුය.

8. මඩකලපුවේ අධ්‍යාපන නිලධාරිවරයා විසින් සකස් කරනු ලබන ගිවිසුම් පත්‍රයේ ඇලවීම සඳහා අවශ්‍ය වටිනාකම් ඇති මුද්දර, තෝරා ගනු ලබන ටැන්ඩර් කරු විසින් සපයා දිය යුතුය.

9. ටැන්ඩර් මණ්ඩලයේ අවසර නොලබා, කොන්ත්‍රාත්තුවක් අන්‍යයෙකුට පැවරීම හෝ අතුරු බද්දක් දීම හෝ නො කළ යුතුය. කොන්ත්‍රාත් කරුවකු විසින් එම කොන්ත්‍රාත්තුව—ඔහු වෙනුවෙන් කරගෙන යෑම සඳහා අන්‍යයකු වෙත පවරන ඇටෝර්නි බලය නොපිළිගැනීමේ හිමිකම රජය සතුව පවතී.

10. මීට පෙර රජයේ කොන්ත්‍රාත්තුවක් නොලත් ටැන්ඩර් කරුවකු විසින් ටැන්ඩරය ඉදිරිපත් කිරීමේදී ඔහුගේ සම්පූර්ණ නම හා දුන් ලිපිනයද, ඔහුට අයිති දේපල, ඒවායේ සවභාවය හා ඒවා පිහිටි දිස්ත්‍රික්කයද, ඒවාට ඇති අයිතිවාසිකමේ ප්‍රමාණයද සඳහන් ප්‍රකාශයක් ලියා ඉදිරිපත් කළ යුතුය.

11. රජයේ කොන්ත්‍රාත් වැඩ කර තිබෙන ටැන්ඩර් කරුවකු විසින් එසේ වැඩ කළ දෙපාර්තමේන්තුවේ නම හා සේවය කළ දිස්ත්‍රික්කයේ නමද ලියා ඉදිරිපත් කළ යුතුය.

12. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවට ඇතුළත් විය යුත්තේ, ලංකාවේ රජය උදෙසාත් ඒ වෙනුවෙනුත් නැගෙනහිර පළාතේ අධ්‍යාපන නිලධාරියා සමගය, ඒ නිලධාරි වරයාගේ පදවි නාමයෙන් අදහස් කරන්නේත්, ඇතුළත් වන්නේත් එවකට ලංකාවේ රජය යටතේ එම තනතුර දරණ නිලධාරිවරයා සහ ඔහුගේ අනුප්‍රාපතිකයනුත් ය.

13. තෝරානනු ලබන ටැන්ඩර් කරු විසින් අධ්‍යාපන නිරධාරි වරයා වෙත ඉදිරිපත් කරන වච්චර හා අනික් ලියකියවිලිවල නිවරද තාවය ගැන ටැන්ඩර්කරු අධ්‍යාපන නිලධාරි වරයාට වගකිව යුතුවේ.

14. ඉදිරිපත් කරනු ලබන ටැන්ඩර් පත්‍ර බහාලන ලියුම් කවරය සීල් තබා "ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ කෙයාර් පිටි ගෙන යාම සඳහා වූ ටැන්ඩරයයි" යනු එම කවරය මුදුනේ ලකුණු කළා ටැන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන විට රෙජිස්ටර් කොට එවිය යුතුය. ප්‍රදේශ වාසී ටැන්ඩර් කරුවන් එසේ රෙජිස්ටර් තැපෑලෙන් එවන්නට අදහස් නොකරතොත් එවැනි ටැන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ ඒජන්ත වරුන් තමන්ගේ ටැන්ඩර් පත්‍ර, අධ්‍යාපන කන්තෝරුවේ තබා තිබෙන ටැන්ඩර් පෙට්ටියේ තමන් විසින්ම බහාලිය යුතුය.

15. ලැබෙන ටැන්ඩර් පත්‍ර අධ්‍යාපන නිලධාරි වරයාගේ කාර්‍යාලයේ දී 1959 අප්‍රේල් මස 24 වැනි දින පෙ. ව. 9.30 පසුවූ වහාම විවෘත කරනු ලැබේ.

16. ලැබෙන ටැන්ඩර් ඉදිරිපත් කරන අවස්ථාවේදී ටැන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් ගේ මිල ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවා දෙනු ලැබේ. ටැන්ඩර් පත්‍රයක් සමීක්ෂණය කිරීමට කැමති ඕනෑම ටැන්ඩර් කරුවකුට ටැන්ඩර් මණ්ඩලයේ සභාපති සමග හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකු සමග හෝ පිළියෙළ කර ගැනීමෙන් පසු ඉදිරිපත් කර තිබෙන ඕනෑම ටැන්ඩර් පත්‍රයක දෙවෙනි පිටපත සමීක්ෂණය කිරීමට අවසර දෙනු ලැබේ.

සී. තනිකාසලම්,
නැගෙනහිර පළාතේ වැ. බ. අධ්‍යාපන නිලධාරි තැන.

1959.4.2.

### උපලේඛනය

(i) මුතූර් පාර.

1. බඩු සැපයීමේ ස්ථානයේ සිට මුතූර් ජැටිය දක්වා ; බෝට්ටුවෙන් —රු. 50හේ මිටියකට...........බැගින්

2. ජැටියේ සිට මුතූර්හි බේකරිවලට පොදුවේ—රු. 50හේ මිටියකට ...........බැගින්

3. මුතූර්හි සිට ඉච්චලම් පත්තෙ, කිලිවෙට්ටි සහ තෝප්පූර් යන තැන්වලට රු. 50හේ මිටියකට හැතැප්මකට........... බැගින්.

(ii) ගෝමරන් කඩවල.
රු. 50හේ මිටියකට හැතැප්මකට...........බැගිනි.

(iii) තිරිකුණාමලේ නගරය.
පොදුවේ රු. 50හේ මිටියකට...........බැගින්.
(හැතැප්ම ගණන සැලකිය යුතු නොවේ).

(iv) තම්පලගාමම්, කන්තලේ සහ නිලාවේලි.
රු. 50හේ මිටියකට හැතැප්මකට...........බැගින්.

(v) කුච්චවේලි සහ පුල්මොට්ටේ
රු. 50හේ මිටියකට හැතැප්මයකට...........බැගින්.

(vi) චීන වරාය සහ කින්නියා.
රු. 50හේ මිටියකට හැතැප්මයකට...........බැගින්.

(vii) ඉච්චලම්පත්තේ, කුනිතීව්, කිලිවේට්ටි සහ තෝප්පූර්.
රු. 50හේ මිටියකට හැතැප්මයකට...........බැගින්.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් බෝඩ් සභාපති තැන විසින් 24. 4. 59 දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම. | වැඩ විස්තර. |
|---|---|
| (1) බ.දි./මොණරාගල මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ලක් සහ වැසිකිළි තැනීම. |
| (2) බ.දි./වගුරුවෙල මිශ්‍ර පාඨශාලාව | පාසැල් ගොඩනැගිල්ලක්, ගුරු නිවාසයක් සහ වැසිකිළි තැනීම. |
| (3) බ.දි./පස්සර මධ්‍යම විද්‍යාලය | රසායනාගාරයක් තැනීම. |

සංලක්ෂය: බ.දි. = බදුලු දිස්ත්‍රික්කය.

2. අංක 1 සඳහා රුපියල් 15,000 ඉහල, අංක 2 සහ 3 සඳහා රුපියල් 25,000 ඉහල, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1 සඳහා රුපියල් 25,000 ඉහල අංක 2 සහ 3 සඳහා රුපියල් 50,000 ඉහල, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ කාර්‍යාලයේ ඒ. සී., ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය සඳහා රු. 100 තැන්පත් කළ කුවිතාන්සියක් බන්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කිරීමෙන් 23. 4. 59 පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි, කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්‍යාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡෙදයේ සඳහන් පරිදි ලියා පදිංචි වී සිටින බව ඔප්පු කල හැකි අයට පමණි.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තර බන්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. කොළඹ 2, මලයි

වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් බෝඩ් සභාපති තැනට ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. දේශිය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්‍යාල සහකාර තැනට භාර දී, එසේ භාර ගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුලත් කවරය මත ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනයත් වැඩයෙහි විස්තරත් කළ යුතුයි.

5. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 24.4.59 දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුල විවෘතව තැබිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන් විසින් සේවය සඳහා බඳවා ගත හැක්කේ එම වැඩ කරන ප්‍රදේශයේ පදිංචි පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් පමණි. මෙය කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් වශයෙන් සලකන බවත් එසේ කිරීමට අසමත් වන කොන්ත්‍රාත්කරුවන් කොන්දේසි කඩකලවුන් හැටියට සලකනු ලබන බවත් සැලකිය යුතුයි. විශේෂ හේතූන් උඩ අධ්‍යාපන අධ්‍යක්ෂක තැන අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා සමග සාකච්ඡාකොට, ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් යෙදවීමට අවසරයක් දුන්නොත් හැර එසේ අවසරයක් නොමැතිව එවැනි කම්කරුවන් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවන බව සැලකිය යුතුයි. අනුමැතියක් හෝ සම්මතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් හෝ යෙදවීම තහනම්ය.

ඊ. නාගොඩවිතාන,
ඌව පලාතේ අධ්‍යාපන නිලධාරි තැන.

1959 අප්‍රේල් 3 වෙනි දින,
අධ්‍යාපන කාර්‍යාලය,
බන්ඩාරවෙල.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බන්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැන විසින් 24. 4. 59 දින පෙරවරු 9.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | වැඩ විස්තර |
|---|---|
| (1) බ.දි./කොස්ලන්ද මහා විද්‍යාලය | ක්‍රීඩා භූමියක් තැනීම. |

**සංලක්ෂ්‍යය.**—බ.දි.= බදුලු දිස්ත්‍රික්කය.

2. අංක 1 සඳහා රුපියල් 5,000 ඉහල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 10,000 ඉහල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්‍යාලයේ ඒ. සී. ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය සඳහා රු. 100 තැන්පත් කල කුවිතාන්සියක් බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කිරීමෙන් 23.4.59 පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි, කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්‍යාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ඌව පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් පරිදි ලියා පදිංචි වී සිටින බව ඔප්පු කල හැකි අයට පමණි.

4. ඉහත සඳහන් පරිදී පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා ඌව පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තර බන්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. බන්ඩාරවෙල අධ්‍යාපන කාර්‍යාලයට ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කල තැපෑලෙන් යැවිය යුතුයි. දේශිය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කල තැපෑලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් බන්ඩාරවෙල අධ්‍යාපන කාර්‍යාල සහකාර තැනට භාර දී, එසේ භාර ගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි. මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුලත් කවරය මත ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනයත් වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. බන්ඩාරවෙල අධ්‍යාපන කාර්‍යාලයේදී 24. 4. '59 දින පෙරවරු 9.30 ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුල විවෘතව තැබිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන් විසින් සේවය සඳහා බඳවා ගත හැක්කේ එම වැඩ කරන ප්‍රදේශයේ පදිංචි පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් පමණි. මෙය කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් වශයෙන් සලකන බවත් එසේ කිරීමට අසමත් වන කොන්ත්‍රාත් කරුවන් කොන්දේසි කඩකලවුන් හැටියට සලකනු ලබන බවත් සැලකිය යුතුයි. විශේෂ හේතූන් උඩ අධ්‍යාපන අධ්‍යක්ෂක තැන අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා සමග සාකච්ඡාකොට, ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් යෙදවීමට අවසරයක් දුන්නොත් හැර එසේ අවසරයක් නොමැතිව එවැනි කම්කරුවන් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවන බව සැලකිය යුතුයි. අනුමැතියක් හෝ සම්මතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් හෝ යෙදවීම තහනම්ය.

ඊ. නාගොඩවිතාන,
ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැන.

1959 අප්‍රේල් 3 වෙනි දින,
අධ්‍යාපන කාර්‍යාලය,
බන්ඩාරවෙල.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් වැඩ කරවීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා වර්ෂ 1959 ක් වූ මැයි 5 වැනි අඟහරුවාදා උදය 10 වනතෙක් බාරගනු ලැබේ :—

(1) පානදුර ආරෝග්‍යශාලාවට වතුර බැසයන කාණු තැනීම.

2. ටෙන්ඩර් පත්‍රිකා වර්ෂ 1959 අප්‍රේල් 30 වැනි කිවිදා සවස 4 වනතෙක් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් නිකුත් කරනු ලබන්නේ, මින් පෙර රුපියල් 3,000/- කට වඩා වටිනා කම ඇති කානු තැනීම හෝ ඒ හා සමාන අන් වැඩ සඳහා පළපුරුදු රජයේ හෝ නාගරික සභාවන්හි ලියාපදිංචි වී සිටින බව ලියවිලි වලින් ඔප්පුකළ හැකි කොන්ත්‍රාත් කරුවනට පමණක් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ සෑම ටෙන්ඩරයක් සඳහාම රුපියල් 25/- ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉරිපත් කිරීමෙන් අනතුරුවය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙරාතුව ඉල්ලුම් කරුවන් විසින් සැලසුම්, විස්තර විභාග සහ ගිවිසුම් යනාදී කරුණු ගැන අවශ්‍ය විස්තර ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගත්තා ලෙසද වැඩය අරඹන භූමිය පරීක්ෂාකරන ලෙසද නිවේදනය කරනු ලැබේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට ප්‍රථම තෝරාගත් අයදුම් කරු විසින් 5% වැඩි නොවන ඇප මුදලක් නියමිත කොන්ත්‍රාත්තුව අවංක ලෙස නිම කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරුතුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළයුතු වෙයි.

5. ටෙන්ඩර් අයදුම් පත් කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්‍යාලයේ අංක 155 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලන්න. නැතහොත් රෙජිස්තර තැපෑලෙන් යවන්න. අයදුම් කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් ඉල්ලීම් රෙජිස්තර තැපෑලෙන් එවීමට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම් කරුගේ නමත්, ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් අයදුම් පත් බාර ගැනුමට බලයදී තිබෙන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් තුමාට බාර දියයුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් අයදුම්පත බාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ අයුරු ටෙන්ඩර් බාරගැනුම නවතා ලූ දින පටන් මසක් තුළ අයදුම් කරුවන් විසින් ඉදිරිපත් කළ මිළ ගණන් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

3.4.59.
ටොරිංටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ.

ඊ. බී. ඇන්කිටෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

### සෞඛ්‍ය දෙපාතීමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1959 මැයි මස 12 වෙනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) බණ්ඩාරවෙල රෝහලට මිනිකාමරයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1959 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්දා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 15,000 වඩා වටිනාකමැති ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂාකර බැලීමටත් අයදුම්කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරිමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කායයීලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත්, ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකු ටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. බී. ඇන්කිවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

4.4.59.
ටොරිංටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.

---

### සෞඛ්‍ය දෙපාතීමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තය තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1959 මැයි 12 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) බෙලිඅත්ත රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම (ද. ප.).

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1959 මැයි 8 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ, රුපියල් 20,000 වඩා වටිනාකමැති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂාකර බැලීමටත් අයදුම්කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරිමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත්, ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකු ටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. බී. ඇන්කිවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

6.4.59.
ටොරිංටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.

---

### ජාතික නිවාස දෙපාතීමේන්තුව

#### කොල්ලුපිටියේ නිවාස යෝජනා ක්‍රමයේ පස් මහල් නිවාස පංතියක් තැනීම

1959.3.9 දින ගැසට් පත්‍රෙහි 1959.3.2 දතමින් දිර්ඝ කරන ලද ඉහත සඳහන් ටෙන්ඩර් කැඳවීමේ දිනය, තවදුරටත් 1959.4.17 දින උදේ 10 වන තෙක් දිර්ඝ කළ බව දන්වමි.

ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 15 වන බදාදා දවල් 12 වන තෙක් ලබාගත හැක.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 අප්‍රේල් 3,
ජාතික නිවාස දෙපාතීමේන්තුව,
කොළඹ 1,
තැ. පෙ. 544,

---

### ජාතික නිවාස දෙපාර්තමේන්තුව

#### හිප්පොල, තලාතුඔය 1 ඩබ්ලිව් වගීයේ ගෙවල් 10ක් තැනීම

හිප්පොල, තලාතුඔය නමැති ගමෙහි 1 ඩබ්ලිව් වගීයේ ගෙවල් 10ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 මැයි මස 15 වෙනි දින සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාතක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 40,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 40ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 මැයි මස 13 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 අප්‍රේල් 3 වැනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නෙ. 544, කොළඹ 1.

---

### ලුණුම්දෙල්ල සිලින් ලෑලි සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1959ක්වූ මැයි මස 13 වන බදාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්ත මේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්ෂ 1959ක් වූ මැයි මස 8 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1959ක් වූ මැයි මස 13 වන දින පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ජී. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

1959 අප්‍රේල් මස 9 වන දින,
තැ. පෙ. 540,
කොළඹ.

---

## විදුලි පහන් සැපයීමේ සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාරතැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොළොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1959ක් වූ මැයි මස 20 වන බදාදා පූ. භා. 9.30 දක්වා ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැක්ලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්ෂ 1959ක් වූ මැයි මස 15 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1959ක් වූ මැයි මස 20 වන දින පූ. භා. 10ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ජී. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන
කළමනාකාර තැන.

1959 අප්‍රේල් මස 9 වන දින,
තැ. පෙ. 540, කොළඹ.

---

## දුම්රිය දෙපාර්තමේන්තුව

### පරණ උළු සහ පස් විකිණීම

කොළඹ මැකලම් පාරේ රේල්වේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලය අසල තිබෙන පරණ උළු 45,000ක් සහ පස් කියුබ් 250ක් පමණ විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර, දෙමටගොඩ දුම්රිය දෙපාර්තමේන්තුවේ මධ්‍යම දිස්ත්‍රික්කය භාර ඉංජිනේරු තැන විසින් මෙම අප්‍රේල් මස 17 වෙනි සිකුරාදා පෙරවරු 10 වෙනතුරු භාරගනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් විසින් උළු 1,000ක් සහ පස් කියුබ් එකක් මෙපමණ මිළකට ගැනීමට සතුටුයයි සඳහන් කළ යුතුයි.

සෑම ටෙන්ඩරයක් සමගම රු. 25ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් එවිය යුතුයි. මේ මුදල දුම්රිය පලකට හෝ කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට හෝ ගෙවීමෙන් කුවිතාන්සියක් ලබාගත හැක. වෙන යම් ක්‍රමයකින් මුදල් තැන්පත් කළ බවට ඉදිරිපත් කරන කුවිතාන්සි භාරගනු නොලැබේ.

පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දැන්වූ විගස ඒ සඳහා ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා කුවිතාන්සියක් ලබාගෙන එදින සිට සතියක් ඇතුළතදී උළු හා පස් තොගය සම්පූර්ණයෙන් එම සථානයෙන් ඉවත් කරගත යුතුයි.

ඇස්. ආර්. අරුලම්බලම්,
දිස්ත්‍රික් ඉංජිනේරු තැන,
දුම්රිය දෙපාර්තමේන්තුවේ මධ්‍යම දිස්ත්‍රික්කය,
දෙමටගොඩ.

1959.4.1. දින,
දෙමටගොඩදීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

සම්මත උපකරණ සහිත මධ්‍යම ලියන පට්ටල් සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර නාරාහේන්පිට කිරුළ පාරෙහිවූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1959 ජූනි මස 10 වෙනිදා වන බදාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්ම කොළවල ලියා අනුපිටපතකින් ද යුක්තකොට එවිය යුතුයි. මේ පෝර්ම කොළ බොරලැස්ගමුවේ වේරහැර වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කාර්යාලයෙන් 1959යේ ජූනි මස 9 වෙනිදා වන අඟහරුවාදා දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ඒවා දෙන්නේ රුපියල් 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම් තැන.

1959 අප්‍රේල් මස 1 වෙනි ද,
කොළඹදීය.

---

## ගමනාගමන මණ්ඩලය

වේරහැර මධ්‍යම වැඩපොළ පිහිටි ඉඩමේ පාලනකාර්‍ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ටෙන්ඩර පත්‍ර එවන ලෙස කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි සථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් මෙයින් ආරාධනය කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීම 1959යේ මැයි මස 6 වෙනි ද වන බදාදා පෙ. ව. 10ට නවත්වනු ලැබේ.

රුපියල් 2,75,000 හෝ ඊට වැඩි වියදමක් යන කර්මාන්ත වෙනුවෙන් ලියා පදිංචිවූ ආණ්ඩුවේ කොන්ත්‍රාත්කරුවෝ පමණක් මේ සඳහා ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝය.

ටෙන්ඩර ලිපි දිය හැක්කේ බොරලැස්ගමුවේ වේරහැර මධ්‍යම වැඩපොළේ සිවිල් ඉංජිනේරු මහතාගේ කාර්යාලයෙහි එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් රු. 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළාට පසුවය.

1959යේ මැයි මස 2 වෙනි ද වන සෙනසුරාදා දවල් 12 වන තෙක් සිවිල් ඉංජිනේරු මහතා විසින් ටෙන්ඩර ලිපි නිකුත් කරනු ලැබේ.

සියලු ටෙන්ඩර පත්‍ර ලියා එවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන පෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම් තැන.

1959යේ අප්‍රේල් මස 1 වෙනි දින,
කොළඹදීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

මහරගම 1 වෙනි ශ්‍රේණියේ ඩිපෝවෙහි පහත නම් සඳහන්වන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ටෙන්ඩර පත්‍ර එවන ලෙස කොළඹ 5, නාරාහේන්පිට කිරුල පාරේ 200 වෙනි සථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් මෙයින් ආරාධනා කරනු ලැබේ:—

(අ) 5 වෙනි බේ එකේ වැඩ මඩුවට කැල්ලක් ගැනීම,

(ආ) කාර්යාලයීය ගොඩනැගිලි,

(ඇ) ගබඩා සහ වඩු වැඩ ගොඩනැගිල්ල.

ටෙන්ඩර පත්‍ර භාරගැනීම 1959යේ අප්‍රේල් මස 29 වෙනි ද වන බදාදා පෙ. ව. 10 ට නවත්වනු ලැබේ.

රු. 60,000 හෝ ඊට වැඩි වියදමක් යන කර්මාන්ත වෙනුවෙන් ලියාපදිංචි වූ ආණ්ඩුවේ කොන්ත්‍රාත්කරුවෝ පමණක් මෙ සඳහා ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝය.

ටෙන්ඩර ලිපි දියහැක්කේ බොරලැස්ගමුවේ වේරහැර මධ්‍යම වැඩපොළේ සිවිල් ඉංජිනේරු කාර්‍යාලයෙහි එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් රු. 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළාට පසුවය.

1959 යේ අප්‍රියෙල් 25 වෙනි දා වන සෙනසුරාදා දවල් 12 වන තෙක් සිවිල් ඉංජිනේරු මහතා විසින් ටෙන්ඩර ලිපි නිකුත් කරනු ලැබේ.

සියලු ටෙන්ඩර පත්‍ර ලියා එවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන පෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම් තැන.

1959 අප්‍රියෙල් මස 3 වෙනි දින,
කොළඹදීය.

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු බෝතල් පිරවීම සඳහා ටැන්ඩර්

පහත සඳහන්වන සුරාබදු ගුදම්වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා, එක් අවුරුදු කාලයක් තුළ අරක්කු බෝතල පිරවීම සඳහා ටැන්ඩර් පත්‍ර, ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, වර්ෂ 1959ක්වූ අප්‍රියෙල් මස 30 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.30 වනතෙක් භාර ගනු ලැබේ.

| | |
|---|---|
| මඩකලපුව<br>බදුල්ල | 1959 ජූලි 1 වැනිදා පටන් |
| කළුතර<br>මහනුවර<br>යාපනය | 1959 අගෝස්තු 1 වැනිදා පටන් |
| මීගමුව<br>ත්‍රිකුණාමලය | 1959 සැප්තැම්බර් 1 වැනිදා පටන් |

2. මේ පිළිබඳ සියළුම විස්තර දැනගත හැකි සුරාබදු කොමසාරිස් තැනගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත් පෝර්මවල ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

පී. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස්.

1959 අප්‍රියෙන් 4 වැනි දින,
සුරාබදු කොමසාරිස් තැනගේ කාර්‍යාලය,
කොළඹ.

---

## ධීවර පර්‍යේෂණාගාරය

### පිටිපන පොකුණු හෑරීම සහ සොරොව් සෑදීම

වර්ෂ 1959ක්වූ අප්‍රේල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තුරු ගාලු මුවදොර, ධීවර පර්‍යේෂණාගාරයේ ධීවර අධිකාරි තැන විසින් පිටිපන පොකුණු හෑරීම සහ සොරොව් සෑදීම සඳහා ටෙන්ඩර භාර ගන්නවා ඇත.

2. මගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි. මේ සම්බන්ධව වැඩි තොරතුරු මගෙන් ලබා ගත හැක.

3. ටෙන්ඩර තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 අප්‍රේල් මස 28 වෙනිදා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර පෝරම කොළ ලබාගත හැක.

ඩී. ´පී. ඊ. ඒ. ද පොන්සේකා,
ධීවර අධිකාරී.

ධීවර පර්‍යේෂණාගාරය, ගාලු මුවදොර,
කොළඹ, 3.4.59.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

මොරටුවේ වෙලෝනා කර්මාන්ත පර්යේෂණායතනයෙහි මැටි බඳුන් කර්මාන්ත ශාලාවකට ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 59.5.5 දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනෙන්නේ රු. 25,000 ට සහ ඊට වැඩි වැඩ සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණකි. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම සඳහා රු. 50 ඇප මුදලක් තැන්පත් කළ යුතුය.

ජී. වී. පී. සමරසිංහ,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන.

ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7.
1959 අප්‍රේල් මස 6 දින,

---

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නතුවල-ඕලුආර පාරේ පහත සඳහන් වැඩ සඳහා 1959 අප්‍රේල් 24 වෙනි දින පෙරවරු 9.30 දක්වා පහත අත්සන් කරන මවිසින් ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

නතුවල-ඕලුආර පාරේ පාලමක් තැනීම.

2. හම්බන්තොට දිසාපති තැන නමට රු. 50ක මුදලක් හම්බන්තොට කච්චේරියේ තැන්පත් කර ලබාගන්නා කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන් හම්බන්තොට කච්චේරියේ ග්‍රාම සංවර්ධන අංශයෙන් 1959 අප්‍රේල් මස 21 දින දවල් 12 වන තෙක් ලබාගන්නා ටෙන්ඩර් පත්‍රවල පමණක් ඉල්ලුම් කළ යුතුය. තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ තෝරාගත් ඉල්ලුම්කරු ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසුවය.

3. 1959 අප්‍රේල් 24 දින පෙරවරු 9.30ට හම්බන්තොට කච්චේරියේ දිසාපති තැන විසින් ටෙන්ඩර් විවෘත කරන විට කොන්ත්‍රාත් කරුවන්ට ද පැමිණ සිටිය හැක.

4. ටෙන්ඩර් පත්‍ර අඩංගු සීල් තැබූ කවරවල උඩ වම් කෙළවරෙහි ඉල්ලුම් කරන ලද වැඩ කොටසේ නම සඳහන් කළ යුතුය. එක කවරයක එක ටෙන්ඩරයකට වඩා ඇතුළත් නොකළ යුතුය.

5. යම් කොන්ත්‍රාත් කරුවෙක් තමාගේ ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නෙහි නම් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි කොන්ත්‍රාත්කරුගේ නම සහ ලිපිනය පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත්, වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

7. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු විසින් කොන්දේසි පත්‍ර අත්සන් කිරීමට පෙර ඔහුගේ ටෙන්ඩරයේ මුදලින් සියයට පහකට වැඩි නොවූ මුදලක් දිසාපති තැන නමට හම්බන්තොට කච්චේරියේ තැන්පත් කළ යුතුය. මේ ඇප මුදල ආපසු ගෙවනු ලබන්නේ වැඩය නිම කිරීමෙන් මාස තුනකට පසුවය.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ ඉන් කොටසක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය හම්බන්තොට දිසාපති තැන සතුය.

ටී. සිවඥානම්,
හම්බන්තොට දිසාපති තැන.

26.3.59,
දිසාපති කාර්යාලය, හම්බන්තොට.

---

බදුල්ලේ යාන්ත්‍රික බඩු කර්මාන්ත ශාලාවක් සහ වැසිකිළියක් තැනීම සඳහා බදුලු දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් වර්ෂ 1959 ක්වූ අප්‍රේල් මස 25 දින පෙරවරු 11.30 වන තෙක් ටැන්ඩර් බාරගනු ලැබේ.

2. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ/අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ/වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් දෙපාර්තමේන්තුවක රු. 25,000 ට ඉහල ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවනට රු. 25.00 ක් තැන්පත් කළ බවට කච්චේරි රිසිට් පතක් ඉදිරිපත් කළ විට 1959 අප්‍රේල් මස 24 දින දවල් 12 වන තුරු ටැන්ඩර් පෝරම බදුලු කච්චේරියේ ග්‍රාම සංවර්ධන අංශයෙන් ලබා ගත හැක.

3. සීල් තබන ලද ටැන්ඩර් කවරයෙහි "බදුල්ලේ යාන්ත්‍රික වඩු කර්මාන්ත ශාලාවක් සහ වැසිකිළියක් තැනීම සඳහා ටැන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කොට කච්චේරියේ ටැන්ඩර් පෙට්ටියෙහි දැමිය යුතුය. නොඑසේනම්, 1959 අප්‍රේල් මස 25 දින පෙරවරු 11.30 ට පෙර ලැබෙන්නට ලියා පදිංචිකළ තැපැලෙන් එවිය යුතුය.

4. 1959 අප්‍රේල් මස 27 දින පෙරවරු 10 ට ටැන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටැන්ඩර් කරුවනටද එය බලා ගැනීම සඳහා කච්චේරියේ පෙනී සිටිය හැක.

5. ටැන්ඩර්කරුවන් මෙකී වැඩය 1959 ජූලි මස 31 දිනට අවසාන කළ යුතුය.

6. වැඩිදුර විස්තර බදුලු කච්චේරියේ ග්‍රාම සංවර්ධන අංශයෙන් ලබා ගත හැක.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුලු දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා.

කච්චේරිය, බදුල්ල.
2. 4. 59.

කොළඹ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂය රෝග ආධාර මුදල් ගෙවන ශාඛා ගොඩනැගිල්ල විශාල කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ මැයි මස 6 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී, බදාදා පෙරවරු 10.30 ට, ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්මේන්තුවේ කොළඹ බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ අප්‍රියෙල් මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 37,000 ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇල්. සී. විලියම්ස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 4. 6.

---

මාතර හිරගෙදර ගාඩනැගිලි අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ අප්‍රියල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී, බදාදා පෙරවරු 10.30, ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කායර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000 ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇල්. සී. විලියම්ස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 4. 6.

---

වව්නියාවේ ගොවිපාසැලේ කම්කරු නිවාසයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ මැයි මස 6 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී, බදාදා පෙරවරු 10.30 ට, ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. වව්නියාවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 15,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇල්. සී. විලියම්ස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 4. 6.

---

ත්‍රිකුණාමලේ ෆ්‍රෙඩ්රික් කොටුවේ ඇති නාවික ගොඩනැගිලිවල විශෙෂ අළුත් වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ මැයි මස 6 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී, බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ත්‍රිකුණාමලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ අප්‍රියෙල් මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 38,000 ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇල්. සී. විලියම්ස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.4.6.

---

නාලන්ද නානායම අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ අප්‍රියල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී, බදාදා පෙරවරු 10.30 ට, ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. නාලන්දේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ අප්‍රියෙල් මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,500 ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ වට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇල්. සී. විලියම්ස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 4. 6.

මහඉලුප්පල්ලම ගොවි පලේ පොලව යට ගැලුම් 50,000ක ටැන්කියක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959යේ මැයි මස 6 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මරදන්කඩවල ආ. වැ. දෙපාර්මේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිට පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959 යේ අප්‍රියෙල් මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 55,000 ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 180ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇල්. සී. විලියම්ස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 4. 6.

---

පලේසි දිස්ත්‍රික්කයේ උරුත්තිරාපුරම් මාතෘ නිවාසයේ මූළුතැන් ගෙයක් සෑදීම හා ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959 යේ මැයි මස 6 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී, බදාදා පෙරවරු 10.30 ට, ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පලේසි ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔයුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959 යේ අප්‍රියෙල් මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 16,000 ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇල්. සී. විලියම්ස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59. 4. 6.

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**ඇළුමිනියන් තහඩුවලින් සම්පූර්ණ කරන ලද ගොඩනැගිලි සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම—ටෙන්ඩර් ප්‍රතිඵල**

**මෙරට ටෙන්ඩර් අයදුම් පත්‍ර**

1. සීමාසහිත විලියම් ජැක්ස් "සිලෝන්" සහ සමාගම.
2. සීමාසහිත බ්‍රවුන් සහ සමාගම.
3. සීමාසහිත සැමුවෙල් පුත්‍රයෝ සහ සමාගම.
4. සීමාසහිත ඇන්ග්ලෝ එෂියන් සමාගම.
5. සීමාසහිත මැක්වුඩ්ස් සමාගම.
6. එදිරිසිංහ කම්බයින්.

**විදේශීය ටෙන්ඩර් අයදුම් පත්‍ර**

7. බෙල්මන් හැන්ගර්, එක්සත් රාජ්‍යය.
8. සීමාසහිත සරෝ ස්ට්‍රක්චර්, එක්සත් රාජ්‍යය.
9. සැන්ඩර්සි සහ ෆේපාස්ටර්, එක්සත් රාජ්‍යය.
10. නිසන් බල්ඩින්ග්ස්, එක්සත් රාජ්‍යය.
11. ආර්. ඕ. රයිට්, එක්සත් රාජ්‍යය.
12. විකර්ස් ආම්ස්ට්‍රෝන්ග්, එක්සත් රාජ්‍යය.
13. සීමාසහිත වී. අයි. ඒ. ඕස්ට්‍රෙලියා.
14. ප්‍රෆ්ස්ටිල් කෝපරේෂන් ඕස්ට්‍රෙලියා.
15. ලොහමෙම් සහ සමාගම, බටහිර ජර්මනිය.
16. සොසයිටි ඒ. ඊ. ඉතාලිය.
17. ඊ. සී. පී. එක්සත් ජනපදය.
18. ඇෆ්. ෆ්පිලොයිඩ්. ඇෆ්. ඇස්. ඒ., ප්‍රන්සය.
19. ඇකොමාල්, බැල්ජියම.
20. ඇන්. වී. නෙඩල් මැටල් ඉන්ඩස්ට්‍රි පොලිනෝම්, ඕලන්දය.
21. පෙයාර්ලයින් ඇන්ජිනියරින් සමාගම, එක්සත් රාජ්‍යය.
22. කොමොර් කන්ස්ට්‍රක්ෂන් සමාගම, එක්සත් රාජ්‍යය.

### ප්‍රතිඵල

තීරු බද්ද ඇතුළත් නොමැතිව, මුළු මුදල රු. 2,36,600 "සී. අයි. ඇෆ්. කොළඹ" ඇළුමිනියන් තහඩුවලින් සම්පූර්ණ කරන ලද ගොඩනැගිලි 25ක් සැපයීම සඳහා ඇන්. වී. නෙඩල් මැටල් ඉන්ඩස්ට්‍රි "පොලිනෝම් ඕලන්දය" විසින් ඉදිරිපත් කරන ලද ටැන්ඩර් පත්‍රය භාරගන්නා ලදී.

ටී. බී. ඊ. සෙනවිරත්න,
වාරිමාර්ග අධ්‍යක්‍ෂ තුමා වෙනුවට.

1959 මාර්තු මස 10 දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**විදුලි ජනක කට්ටල 35ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීමේ ටෙන්ඩර් ප්‍රතිඵල**

**මෙරට ටෙන්ඩර් අයදුම් පත්‍ර**

1. සීමාසහිත ඩයිමෝ ඒජන්සීස් සමාගම.
2. සීමාසහිත අබ්දුල් රව්තාර් සහ සමාගම.
3. සීමාසහිත බ්‍රවුන් සහ සමාගම.
4. සීමාසහිත ඇන්ග්ලෝ ඒසියන් සමාගම.
5. සීමාසහිත සී. ඇප්. ටී. ඉන්ජිනියරිං සමාගම.
6. සීමාසහිත විලියම් ජැක්ස් "ලංකා" සහ සමාගම.
7. සීමාසහිත හෝර්ස් "ලංකා" සමාගම.
8. සීමාසහිත දෙරෙයි අරුල් සහ සමාගම.
9. සීමාසහිත ෆ්පෘඩෙන්බර්ග් සහ සමාගම.
10. සීමාසහිත හැරිසන් ලිස්ටර් ඉන්ජිනියරිං සමාගම.
11. සීමාසහිත වෝකර් සහ ග්‍රීග් සමාගම.
12. සීමාසහිත යුනයිටඩ් ට්‍රැක්ටර් ඇන්ඩ් එක්විප්මන්ට් සමාගම.
13. සීමාසහිත කාල්බර්ග් සහ සමාගම.
14. සීමාසහිත කළම්බු කොමාර්ෂල් සමාගම.
15. සීමාසහිත බ්ලැක්වුඩ් හොජ්.
16. සීමාසහිත වෝකර් පුත්‍රයෝ සහ සමාගම.
17. සීමාසහිත එක්විප්මන්ට් සහ කන්ස්ට්‍රක්ෂන් සමාගම
18. සීමාසහිත නිපොන් කළම්බු ට්රේඩිං සමාගම.
19. සීමාසහිත ගව්ඩාර්ට් සහ සී "ලංකා".
20. සීමාසහිත බවුස්ටඩ් "ඊ. සී." සිලෝන් සමාගම.
21. සීමාසහිත සිලෝන් සර්විසස් සහ සප්ලයි සමාගම.
22. සීමාසහිත රෝච් සහ රෝච්.
23. වල්කන් සහ සමාගම.
24. මෙට්රෝ එන්ජිනියර්ස්.
25. පෙරේරා සහෝදරයෝ සමාගම

**විදේශීය ටෙන්ඩර් අයදුම් පත්‍ර**

26. කැනඩාහි සීමාසහිත මෙක්‍රෝන් ඉන්ජිනියරිං ප්‍රොඩක්ට්ස් සමාගම.
27. රුසියාවෙහි මැක්ෂින් එක්ස්පෝට් සමාගම.
28. චීනයෙහි පීපල් රිපබ්ලික් සමාගම.
29. එක්සත් රාජ්‍යයෙහි ස්ටීල් ප්‍රොඩක්ට්ස්.
30. මිලනෝහි ඕ. ඇම්. මිලන්.
31. ඕස්ට්රේලියාහි රොනල්ඩ්සන් ටිෆ්පට් සමාගම.
32. ඕස්ට්රේලියාහි ටුවුම්බා ෆ්පවුන්ඩ්රි පාර්ටි.
33. ස්වීඩන්හි හැගලන්ඩ්ස්.
34. ජපානයෙහි සීමාසහිත වකෝ කොකී.
35. ඇමරිකා එක්සත් ජනපදයෙහි වින්ඩ්පවර් මැනුෆැක්චරින් සමාගම.
36. ලන්ඩන්හි ගිල්බර්ඩ් ජේ. මැකෝල්.
37. හොලන්ඩ්හි සින්ඩට්ච්ස් ඇන්. වී.
38. ඉතාලියෙහි ඇරෝනා.
39. ඉරව් එච් සී—ප්‍රංශය.
40. එංගලන්තයෙහි ග්‍රේහැම් පට්ක්.

41. එක්සත් රාජ්‍යයෙහි හැම්ප්සන් ඉන්ඩස්ට්‍රීස්.
42. එංගලන්තයෙහි සීමාසහිත පිලෝපේන්ස් එංජින්ස්.
43. වීන්හි එලින්.
44. හැම්බර්ග්හි හන්ස්.
45. ඇමෙරිකා එක්සත් ජනපදයේ මෙඩර්න් ඇග්රිකල්චරල් සමාගම.
46. හොලන්ඩිහි කිනිඩර්ඩිජ්.
47. බ්‍රිමන්හි බාසන් සහ කොනන් කැම්ප්.

## ප්‍රතිඵල

**1 වෙනි කොටස.** තීරු බද්ද ඇතුළත් නොමැතිව මුලු මුදල රු. 63,470.76 සී. අයි. ඇෆ්., කොළඹ, 6 කේ. වී. ඒ. විදුලි ජනක කට්ටල 12ක් සඳහා සීමාසහිත කේ. ඇන්. ඒ. සී. රව්දර් සහ සමාගම විසින් ඉදිරිපත් කරන ලද ටැන්ඩර් පත්‍රය භාර ගන්නා ලදී.

**2 වැනි කොටස.** තීරු බද්ද ඇතුළත් නොමැතිව මුලු මුදල රු. 1,40,400 සී. අයි. ඇෆ් : කොළඹ, 12 කේ. වී. ඒ. විදුලි ජනක කට්ටල 15ක් සැපයීම සඳහා සීමාසහිත ඇන්ග්ලෝ ඒසියන් සමාගම විසින් ඉදිරිපත් කරන ලද ටැන්ඩර් පත්‍රය භාර ගන්නා ලදී.

**3 වැනි කොටස.** තීරු බද්ද ඇතුළත් නොමැතිව මුලු මුදල පවුන් 6,020-0-0 සී. අයි. ඇෆ්. කොළඹ, 30 කේ. වී. ඒ. විදුලි ජනක කට්ටල 8ක් සැපයීම සඳහා සීමාසහිත හැම්ප්සන් ඉන්ඩස්ට්‍රීස් එක්සත් රාජ්‍ය විසින් ඉදිරිපත් කරන ලද ටැන්ඩර් පත්‍රය භාර ගන්නා ලදී.

ඊ. බී. ඊ. සෙනවිරත්න,
වාරිමාර්ග අධ්‍යක්‍ෂකතුමා වෙනුවට.

වෑ 1959 මාර්තු මස 23 වෙනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දීය.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

1959 පෙබරවාරි මස ඇතුළත තීරණය කරන ලද ටැන්ඩර පත්‍ර පිළිබඳ විස්තර :—

**සේවය:—** ගුවන් විදුලි යන්ත්‍ර සඳහා පාවිච්චි කරන වියලි බැටරි 300ක් සැපයීමට ටැන්ඩර.

**ටැන්ඩරකරුවන්ගේ නම්.**—(1) සීමාසහිත ද කලම්බු වරේඩර්ස් ; (2) සීමාසහිත බ්‍රවුන් සහ සමාගම ; (3) සමූපකාර තොග වෙළඳ ආයතනය ; (4) සීමාසහිත ලුවිස් බ්‍රවුන් සහ සමාගම ; (5) සීමාසහිත ඩබ්ලිව්. ඒ. විමලධර්ම සහ සමාගම.

**පිළිගත් ටැන්ඩරය ඉදිරිපත් කළ අයගේ නම.—** සීමාසහිත ඩබ්ලිව්. ඒ. විමලධර්ම සහ සමාගම.

**පිළිගත් මිල ප්‍රමාණය:** තීරුබද්ද ඇතුලුව එක් බැටරියක් රු. 9 බැගින් සහ තීරු බද්ද නො මැතිව එක් බැටරියක් රුපියල් 8 බැගින්.

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

1959 මාර්තු මස ඇතුළත තීරණය කරන ලද ටෙන්ඩර් පත්‍ර පිළිබඳ විස්තර :—

**සේවය :** ගුවන් විදුලි යන්ත්‍ර 300ක් සහ අමතර කොටස් සැපයීමට ටෙන්ඩර.

**ටෙන්ඩරකරුවන්ගේ නම් :**

1. සීමාසහිත ඩබ්ලිව්. ඒ. විමලධර්ම සහ සමාගම.
2. සීමාසහිත කලම්බු ඒජන්සීස්.
3. සාන්ත අන්තෝනි හාඩ්වෙයාර් ස්ටෝර්ස්.
4. සීමාසහිත ලයිසරස් ඉලෙක්ට්‍රිකල්ස්.
5. සීමාසහිත බවුස්ටඩ්ස් (ඊ. සහ සී.) සිලෝන්.
6. සීමාසහිත බ්‍රවුන් සහ සමාගම.
7. සීමාසහිත බ්‍රිටිෂ් ඉලෙට්‍රික් සමාගම.
8. සීමාසහිත ස්ටුවට් එන්ජිනියර්ස්.
9. සිල්වා සහ සිල්වා.
10. සීමාසහිත ඇම්. එච්. නූර් බෝයි සහ සමාගම.
11. සීමාසහිත මිලර්ස්.
12. රිදම් හවුස්.
13. විදේශීය ආණ්ඩු සහ පාලන මණ්ඩල වෙනුවෙන් පෙනී සිටින ක්‍රවුන් ඒජන්තවරු හාරේ, සීමාසහිත පිලිප්ස් ඉලෙක්ට්‍රිකල්ස්.
14. විදේශීය ආණ්ඩු සහ පාලන මණ්ඩල වෙනුවෙන් පෙනී සිටින ක්‍රවුන් ඒජන්තවරු හාරේ, සීමාසහිත මර්පි රේඩියෝ.
15. විදේශීය ආණ්ඩු සහ පාලන මණ්ඩල වෙනුවෙන් පෙනී සිටින ක්‍රවුන් ඒජන්තවරු හාරේ, සීමාසහිත පෙ සමාගම.

**පිළිගත් ටෙන්ඩර ඉදිරිපත් කළ අයගේ නම :**

විදේශීය ආණ්ඩු සහ පාලන මණ්ඩල වෙනුවෙන් පෙනී සිටින ක්‍රවුන් ඒජන්තවරු හාරේ, සීමාසහිත පිලිප්ස් ඉලෙක්ට්‍රිකල්ස්.

**පිළිගත් මිල ප්‍රමාණය :**

ගුවන් විදුලි යන්ත්‍ර 300ක් සහ අමතර කොටස්, පවුම් 3,669, සිලිම් 7, පැන්ස 6යි.

---

## විශෙෂ නිවේදනයයි

1959 අප්‍රියෙල් 14 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රියෙල් 17 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රියෙල් 13 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 26 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාර්ඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී